# සාරාංශය

## දූෂණයට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතිය


### පිළිකාමය උවදුරක් වූ

## දූෂණයට සහ වංචාවට එරෙහිව සටන් වැදීම

### පුහු දෙඩවීමකට පමණක් සීමා කරමින්

### එක්සත් ජාතීන්ගේ සම්මුතිය උඩු යටිකුරු කිරීම

***Google Books -*** [***United Nations Convention Against Corruption - Mere 'Rhetoric' to Combat Fraud and Corruption, only subverts United Nations Convention***]()




*විශාලත්වය - 8.25" X 11" - පිටු ගණන 532*

රටක වටිනා සම්පත් රටේ ජනතාව සතු බවත්, පාලකයන් එහි භාරකරුවන් බවත් යන මූලික නියමයන් කිසිම පැකිලීමකින් තොරව උල්ලංඝනය කරමින්, දුගී දුප්පත් ජනතාවගේ එම සම්පත් හා දේපල සූදු කෙළිමක් ලෙස මංකොල්ල කෑම, එය සමකාලීන ලෝකය පුරා ව්‍යාප්ත වී යන දරුණු ගැඹුරු පිළිකා උවදුරක් යයි කර්තෘ විසින් මෙම ග්‍රන්ථයෙන් මනාසේ එළිදරව් කර ඇත.


තවද, මෙම ග්‍රන්ථයේ ප්‍රධාන මාතෘකාව වන්නේ 2005 දෙසැම්බර් මස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දූෂණයට එරෙහිව බලාත්මක කල සම්මුතියයි. කර්තෘ විසින් ඍජුව පෙන්වා දෙනු ලබන්නේ, ගෝලීයව ව්‍යාප්ත වී මුල් බැස තිබෙන එම වංචා සහ දූෂණ ගැඹුරු පිළිකා උවදුරට එරෙහිව දැඩි විවේචනාත්මක දේශන පැවැත්වීමට පමණක් කටයුතු කිරීම, එම සම්මුතිය අඩපණ කිරීමට තුඩු දෙන්නක් ලෙසය.

එම දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතිය සැබෑ ලෙසම ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය පාලකයින් වඩා උනන්දුවෙන් ඇප කැප වී ක්‍රියා කල යුතු බව මෙම ග්‍රන්ථයෙන් එළිදරව් කරනු ලබන අතර, එයට අමතරව පුළුල් ලෙස ගෝලීයව ව්‍යාප්ත වී ඇති එම වංචා සහ දූෂණ පිළිකා උවදුර යන විෂය පිළිබඳව විවේචනාත්මක විග්‍රහයන්ද මෙහි සඳහන් කර ඇත.

මෙම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහිව සම්මුතිය ඇති කිරීමට බීජය රෝපණය කලදා සිටම, එය සම්මුතියක් ලෙස සකස් කොට, එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් එය සම්මත කර ගෙන, එම සම්මුතිය බලාත්මක වන තෙක්, සිදුවූ ඓතිහාසික වැඩමුළු පිළිබඳවද කර්තෘ විසින් අධ්‍යයනය කොට සවිස්තරාත්මකව පැහැදිලි ලෙස මෙහි ඇතුලත් කොට තිබීම, මෙම දූෂණ සහ වංචා විෂය පිළිබඳව හදාරන අයට වටිනා දැනුමක් ලබා ගැනීමට මහඟු අවස්ථාවකි.

එම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහිව සම්මුතියට මුල පුරන ලද්දේ 1970 වර්ෂයේදීය. එසේ සිදු කරන ලද්දේ, ජපානයේ කියෝතෝ නගරයේ පවත්වන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තීරණයක් මත, 2000 දෙසැම්බර් මස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසු, එම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහිව සම්මුතිය සකස් කිරීමට කාරක සභාවක් පත් කරමිනි.

ඉන්පසු, මතභේද සාකච්ඡා වට ගණනාවක් පැවැත්වීමෙන් පසු, 2003 ඔක්තෝබර් මස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පොදු රැස්වීමේදී එම එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතිය සම්මත කර ගෙන, දෙසැම්බර් මස 9 වන දින ලෝකයේ “ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය“ ලෙස නම් කරන ලදී.




එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතිය පිළිබඳ දේශනයක් පැවැත් වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එවකට මහා ලේකම් කොෆි ඒ.අනාන්, අනෙකුත් කරුණු අතරතුර, පහත ප්‍රකාශය සිදු කරන ලදී.


> " දූෂණය පිළිකාවක් සේ සමාජයේ විශාල ලෙස පැතිරෙමින්, සමාජය විනාශයට පත් කරනු ලබයි. එය ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව නීතියේ ආධිපත්‍යයට සහ මානව හිමිකම් අයිතීන් උල්ලංඝනය කරන බවත්, දුගී දුප්පත් ජනතාව තව තවත් දිළිඳුභාවයට පත් කරමින්, සමාජයෙන් ඔවුනට වන අසාධාරණකම් හේතුවෙන්, එවැනි සමාජයේ කොටස් අසහනයට පත් වී, කැරලි කෝලාහල ඇති කිරීමට පෙළඹී, අයුධ සන්නද්ධ ත්‍රස්තවාදයට මුල පුරනු ලබයි.
>
> මෙය විශාල මෙන්ම කුඩා රටවල්වල, දුප්පත් රටවල් මෙන්ම, ධනවත් රටවල් අතරද ව්‍යාප්තව ගොස් ඇති අතර, නමුත් එහි බලපෑම සංවර්ධනය වන ලෝකයේදී ඉතාමත් විනාශකාරී වේ. දූෂණය මගින්, සංවර්ධනය සඳහා රිසි අරමුදල් අසමානුපාතිකව යොමු කර දුප්පතුන් වේදනාවට පත් කර, මූලික සේවා සැපයීම සඳහා රජයට ඇති හැකියාව යටපත් කර, පෝෂණය අසමානතාව සහ අයුක්තිය ඇති කර, සහ විදේශ ආධාර හා ආයෝජන අධෛර්යමත් කරනු ලබයි. දූෂණය යනු, කාර්ය සාධනය යටතේ ආර්ථික මූලික අංගයක් වන අතර, දුප්පත්කම තුරන් කිරීමේ සහ සංවර්ධනය සඳහා පවතින ප්‍රධාන බාධකයකි. "

එම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි වන සම්මුතිය බලාත්මක වූයේ 2005 දෙසැම්බර් මස රටවල් 30 ක් මෙම සම්මුතිය පිළිගෙන, ක්‍රියාත්මක කිරීමට බැඳී, අත්සන් කිරීමෙන් අනතුරුවය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙලෙස වංචා සහ දූෂණයට එරෙහි සම්මුතිය 2005 දෙසැම්බර් මස බලාත්මක වී තිබුණත්, ඊට බොහෝ කාලයකට පෙර සිටම වංචාවට සහ දූෂණයට එරෙහිව කර්තෘ විසින් ක්‍රියාත්මක වී පියවර ගෙන තිබුණ අතර, ඔහුගේ මෙම ග්‍රන්ථ පෙළෙන් එළිදරව් වන ආකාරයට එසේ සිදු කරනු ලැබ ඇත්තේ 1990 වර්ෂයන්හි මුල් භාගයේ සිටය.

ඒ අනුව, ශ්‍රී ලංකාව 2004 මාර්තු මස 31 වන දින එම සම්මුතියට බැඳුණු දෙවන රට බවට පත්වීම විශේෂත්වයක් වූ අතර, එය අත්සනට පමණක් සීමාවී, එක්සත් ජාතීන්ගේ සංවිධාන සම්මුතියේ වගන්ති අනුව, වංචාව සහ දූෂණයට එරෙහිව ශ්‍රී ලංකාව තුල නිසි ක්‍රියා පිළිවෙතක් අනුගමනය නොකර තිබුණු අතර, එවැනි වංචා සහ දූෂණ ක්‍රියාත්මක කිරීමට එරෙහිව නීතියද බලාත්මක නොකර ඒ සඳහා ඉඩදෙමින්, ඒවා වසන් කිරීමට දේශපාලනීය සහ සමාජීය බලපෑම් මත කටයුතු කර, බේදජනක ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට තිබෙන ආයතනද දේශපාලන, සමාජ බලපෑම් සහ පීඩන මත මෙයට පක්ෂව හවුල් වී ඇති බව පිලිඹිබු කරන යථාර්ථයකි. !

2016 සැප්තැම්බර් මස වන විට දූෂණ විරෝධී එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ලේකම් කාර්යාලය වන එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) මගින් නිකුත් කරන ලද පහත සඳහන් ප්‍රස්ථාර හා වගුව අනුව රාජ්‍ය පාර්ශවයන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතියට අත්සන් කොට, එයට දායක පාර්ශවයන්ව සිටින ලදී. - *එනම්:*

# UNCAC Signature and Ratification Status



States Parties
Signatories
Countries that have not signed or ratified the UNCAC

**Signatories: 140**
**Parties: 180**

| ජනපදය | අත්සන | අපරානුමත කිරීම, පිළිගැන්ම (A), අනුමතිය (AA), ප්‍රවේශය (a), අනුප්‍රාප්තිය (d) |
|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | 20.2.2004 | 25.8.2008 |
| ඇල්බේනියාව | 18.12.2003 | 25.5.2006 |
| ඇල්ජීරියාව | 9.12.2003 | 25.8.2004 |
| ඇන්ගෝලාව | 10.12.2003 | 29.8.2006 |
| ඇන්ටිගුවා හා බාර්බුඩා | | 21.6.2006 a |
| ආර්ජන්ටිනාව | 10.12.2003 | 28.8.2006 |
| ආර්මේනියාව | 19.5.2005 | 8.3.2007 |
| ඕස්ට්‍රේලියාව | 9.12.2003 | 7.12.2005 |
| ඔස්ට්‍රියාව | 10.12.2003 | 11.1.2006 |
| අසර්බයිජාන් | 27.2.2004 | 1.11.2005 |
| බහමාස් | | 10.1.2008 a |
| බහරේන් | 8.2.2005 | 5.10.2010 |
| බංග්ලාදේශය | | 27.2.2007 a |
| බාබඩෝස් | 10.12.2003 | |
| බෙලරුස් | 28.12.2004 | 17.2.2005 |
| බෙල්ජියම | 10.12.2003 | 25.9.2008 |
| බෙනින් | 10.12.2003 | 14.10.2004 |
| භූතානය | 15.9.2005 | 21.9.2016 |
| බොලිවියාව | 9.12.2003 | 5.12.2005 |
| බොස්නියාව සහ හර්සගොවිනාව | 16.9.2005 | 26.10.2006 |
| බොට්ස්වානා | | 27.6.2011 a |
| බ්‍රැසීලය | 9.12.2003 | 15.6.2005 |
| බෲනායි දරුස්සලාම් | 11.12.2003 | 2.12.2008 |
| බල්ගේරියාව | 10.12.2003 | 20.9.2006 |
| බර්කිනා ෆාසෝ | 10.12.2003 | 10.10.2006 |
| බුරුන්ඩි | | 10.3.2006 a |
| කබෝ වර්ඩ් | 9.12.2003 | 23.4.2008 |
| කාම්බෝජය | | 5.9.2007 a |

| | | |
|---|---|---|
| කැමරූන් | 10.12.2003 | 6.2.2006 |
| කැනඩාව | 21.5.2004 | 2.10.2007 |
| මධ්‍යම අප්‍රිකානුජනරජය | 11.2.2004 | 6.10.2006 |
| චිලී | 11.12.2003 | 13.9.2006 |
| චීනය [1] | 10.12.2003 | 13.1.2006 |
| කොලොම්බියාව | 10.12.2003 | 27.10.2006 |
| කොමරෝස් | 10.12.2003 | 11.10.2012 |
| කොංගෝවේ | | 13.7.2006 a |
| කුක් දූපත් | | 17.10.2011 |
| කොස්ටා රිකා | 10.12.2003 | 21.3.2007 |
| අයිවරි කෝස්ට් | 10.12.2003 | 25.10.2012 |
| ක්‍රොඒෂියාව | 10.12.2003 | 24.4.2005 |
| කියුබාව | 9.12.2005 | 9.2.2007 |
| සයිප්‍රසය | 9.12.2003 | 23.2.2009 |
| චෙක් ජනරජය | 22.4.2005 | 29.11.2013 |
| කොංගෝප්‍රජාතන්ත්‍රවාදීජනරජය | | 23.9.2010 a |
| ඩෙන්මාර්කය [2] | 10.12.2003 | 26.12.2006 |
| ජිබුටි | 17.6.2004 | 20.4.2005 |
| ඩොමිනිකා | | 28.5.2010 a |
| ඩොමිනිකානු ජනරජය | 10.12.2003 | 26.10.2006 |
| ඉක්වදෝරය | 10.12.2003 | 15.9.2005 |
| ඊජිප්තුව | 9.12.2003 | 25.2.2005 |
| එල් සැල්වදෝරයේ | 10.12.2003 | 1.7.2004 |
| එස්තෝනියා | | 12.4.2010 a |
| ඉතියෝපියාව | 10.12.2003 | 26.11.2007 |
| යුරෝපනු සංගමය | 15.9.2005 | 12.11.2008 AA |
| ෆිජී | | 14.5.2008 a |
| ෆින්ලන්තය | 9.12.2003 | 20.6.2006 A |
| ප්‍රංශය | 9.12.2003 | 11.7.2005 |
| ගැබොන් | 10.12.2003 | 1.10.2007 |
| ගැම්බියාව | | 8.7.2015 a |
| ජෝර්ජියා | | 4.11.2008 a |
| ජර්මනිය | 9.12.2003 | 12.11.2014 |
| ඝානාව | 9.12.2004 | 27.6.2007 |
| ග්‍රීසිය | 10.12.2003 | 17.9.2008 |
| ග්රෙනේඩා | | 1.4.2015 a |
| ගෝතමාලාවේ | 9.12.2003 | 3.11.2006 |
| ගිනියාවේ | 15.7.2005 | 29.5.2013 |
| ගිනි-බිසව් | | 10.9.2007 a |
| ගයනා | | 16.4.2008 a |
| හයිටි | 10.12.2003 | 14.9.2009 |
| ශුද්ධාසනය | | 19.9.2016 a |
| හොන්ඩුරාස් | 17.5.2004 | 23.5.2005 |
| හංගේරියාව | 10.12.2003 | 19.4.2005 |
| අයිස්ලන්තය | | 1.3.2011 a |
| ඉන්දියාව | 9.12.2005 | 9.5.2011 |
| ඉන්දුනීසියාව | 18.12.2003 | 19.9.2006 |
| ඉරානය (ඉස්ලාමීය ජනරජය) | 9.12.2003 | 20.4.2009 |
| ඉරාකය | | 17.3.2008 a |
| අයර්ලන්තය | 9.12.2003 | 09.11.2011 |
| ඊශ්‍රාලය | 29.11.2005 | 4.2.2009 |
| ඉතාලිය | 9.12.2003 | 5.10.2009 |
| ජැමෙයිකාව | 16.9.2005 | 5.3.2008 |
| ජපානය | 9.12.2003 | |
| ජෝර්දානය | 9.12.2003 | 24.2.2005 |

| | | |
|---|---|---|
| කසකස්ථානය | | 18.6.2008 a |
| කෙන්යාව | 9.12.2003 | 9.12.2003 |
| කිරිබටි | | 27.9.2013 a |
| කුවේට් | 9.12.2003 | 16.2.2007 |
| කිර්ගිස්ථානය | 10.12.2003 | 16.9.2005 |
| ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදීජනරජය | 10.12.2003 | 25.9.2009 |
| ලැට්වියාව | 19.5.2005 | 4.1.2006 |
| ලෙබනනය | | 22.4.2009 a |
| ලෙසතෝ | 16.9.2005 | 16.9.2005 |
| ලයිබීරියාව | | 16.9.2005 a |
| ලිබියාව | 23.12.2003 | 7.1.2005 |
| පින්සිපල්ටි | 10.12.2003 | 8.7.2010 |
| ලිතුවේනියාව | 10.12.2003 | 21.12.2006 |
| ලක්සම්බර්ග් | 10.12.2003 | 6.11.2007 |
| මැඩගස්කරය | 10.12.2003 | 22.9.2004 |
| මලාවි | 21.9.2004 | 4.12.2007 |
| මැලේසියාව | 9.12.2003 | 24.9.2008 |
| මාලදිවයින | | 22.3.2007 a |
| මාලි | 9.12.2003 | 18.4.2008 |
| මෝල්ටා | 12.5.2005 | 11.4.2008 |
| මාෂල් දූපත් | | 17.11.2011 |
| මොරිටානියා | | 25.10.2006 a |
| මුරුසිය | 9.12.2003 | 15.12.2004 |
| මෙක්සිකෝව | 9.12.2003 | 20.7.2004 |
| මයික්රොනීසියා (ෆීඩ්රේටඩ් ජනපද) | | 21.3.2012 a |
| මෝල්ඩෝවා | 28.9.2004 | 1.10.2007 |
| මොන්ගෝලියාව | 29.4.2005 | 11.1.2006 |
| මොන්ටිනිග්රෝ [3] | | 23.10.2006 d |
| මොරොක්කෝව | 9.12.2003 | 9.5.2007 |
| මොසැම්බික් | 25.5.2004 | 9.4.2008 |
| මියන්මාරය | 2.12.2005 | 20.12.2012 |
| නැම්බියාව | 9.12.2003 | 3.8.2004 |
| නාඌරු වල | | 12.7.2012 a |
| නේපාලය | 10.12.2003 | 31.3.2011 |
| නෙදර්ලන්තය [4] | 10.12.2003 | 31.10.2006 A |
| නවසීලන්තය | 10.12.2003 | 1.12.2015 |
| නිකරගුවාව | 10.12.2003 | 15.2.2006 |
| නයිජර් | | 11.8.2008 a |
| නයිජීරියාව | 9.12. 2003 | 14.12.2004 |
| නෝර්වේ රාජ්‍ය | 9.12.2003 | 29.6.2006 |
| ඕමාන් | | 9.1.2014 |
| පකිස්ථානය | 9.12.2003 | 31.8.2007 |
| පලාවු | | 24.3.2009 a |
| පැනමා | 10.12.2003 | 23.9.2005 |
| පැපුවා නිව්ගිනියාව | 22.12.2004 | 16.7.2007 |
| පැරගුවේ | 9.12.2003 | 1.6.2005 |
| පේරු | 10.12.2003 | 16.11.2004 |
| පිලිපීනය | 9.12.2003 | 8.11.2006 |
| පෝලන්තය | 10.12.2003 | 15.9.2006 |
| පෘතුගාලය | 11.12.2003 | 28.9.2007 |
| කටාර් | 1.12.2005 | 30.1.2007 |
| කොරියානු ජනරජය | 10.12.2003 | 27.3.2008 |
| රුමේනියාව | 9.12.2003 | 2.11.2004 |
| රුසියානු සමූහාණ්ඩුව | 9.12.2003 | 9.5.2006 |
| රුවන්ඩා | 30.11.2004 | 4.10.2006 |

| | | |
|---|---|---|
| ශාන්ත ලුසියා | | 25.11.2011 |
| සාවෝ ටෝම් සහ ප්රින්සිප් | 8.12.2005 | 12.4.2006 |
| සවුදි අරාබිය | 9.1.2004 | 29.4.2013 |
| සෙනෙගල් | 9.12.2003 | 16.11.2005 |
| සර්බියාව | 11.12.2003 | 20.12.2005 |
| සීෂෙල්ස් | 27.2.2004 | 16.3.2006 |
| සියෙරා ලියොන් | 9.12.2003 | 30.9.2004 |
| සිංගප්පූරුව | 11.11.2005 | 06.11.2009 |
| ස්ලෝවැකියාව | 9.12.2003 | 1.6.2006 |
| ස්ලෝවේනියාව | | 1.4.2008 a |
| සොලමන් දූපත් | | 6.1.2012 a |
| දකුණු අප්‍රිකාව | 9.12.2003 | 22.11.2004 |
| දකුණු සුඩානය | | 23.1.2015 a |
| ස්පාඤ්ඤය | 16.9.2005 | 19.6.2006 |
| ශ්‍රී ලංකාව | 15.3.2004 | 31.3.2004 |
| පලස්තීන රාජ්‍ය | | 2.4.2014 a |
| සුඩානය | 14.1.2005 | 5.9.2014 |
| ස්වාසිලන්තය | 15.9.2005 | 24.9.2012 |
| ස්වීඩනය | 9.12.2003 | 25.9.2007 |
| ස්විට්සර්ලන්තය | 10.12.2003 | 24.9.2009 |
| සිරියානු අරාබි ජනරජය | 9.12.2003 | |
| ටජිකිස්ථානය | | 25.9.2006 a |
| තායිලන්තය | 9.12.2003 | 1.3.2011 |
| මැසිඩෝනියාව හිටපු යුගෝස්ලාවියානු සමූහාණ්ඩුව | 18.8.2005 | 13.4.2007 |
| ටිමෝරය-ලෙස්ටේ | 10.12.2003 | 27.3.2009 |
| ටෝගෝ | 10.12.2003 | 6.7.2005 |
| ට්රිනිඩෑඩ් සහ ටොබැගෝ | 11.12.2003 | 31.5.2006 |
| ටියුනීසියාව | 30.3.2004 | 23.9.2008 |
| තුර්කිය | 10.12.2003 | 9.11.2006 |
| ටර්ක්මෙනිස්තානය | | 28.3.2005 a |
| ටුවාලු | | 04.9.2015 a |
| උගන්ඩාව | 9.12.2003 | 9.9.2004 |
| යුක්රේනය | 11.12.2003 | 02.12.2009 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 10.8.2005 | 22.2.2006 |
| මහා බ්‍රිතාන්‍ය සහ උතුරු අයර්ලන්තය එක්සත් රාජධානිය [5] | 9.12.2003 | 9.2.2006 |
| ටැන්සානියා එක්සත් ජනරජය | 9.12.2003 | 25.5.2005 |
| ඇමරිකා එක්සත් ජනපදය | 9.12.2003 | 30.10.2006 |
| උරුගුවේ | 9.12.2003 | 10.1.2007 |
| උස්බෙකිස්තානය | | 29.7.2008 a |
| වනුආටු | | 12.7.2011 a |
| වෙනිසියුලාව (බොලිවේරියානු ජනරජයේ) | 10.12.2003 | 2.2.2009 |
| වියට්නාමය | 10.12.2003 | 19.8.2009 |
| යෙමනය | 11.12.2003 | 7.11.2005 |
| සැම්බියාව | 11.12.2003 | 7.12.2007 |
| සිම්බාබ්වේ | 20.2.2004 | 8.3.2007 |

කර්තෘ මෙම ග්‍රන්ථයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතියේ වගන්ති මනාසේ ඉදිරිපත් කරමින්, ඒ පිළිබඳව වටහා දීමක් සිදු කර ඇත. එම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතිය රාජ්‍ය අංශයන්හි මහජන දේපල සහ මුල්‍ය පාලකයන්ට පමණක් නොව, ඒ ලෙසම පෞද්ගලික අංශයේද මහජන දේපල සහ මුදල් පාලනය කරන

පාලකයන්ට එරෙහිව එම සම්මුතිය එක සමානවම බලාත්මක වේ. ඒ අනුව රජයේ අංශයන් පමණක් නොව, පෞද්ගලික අංශයද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතියේ වගන්ති වලට යටත් වන අතර, ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතියේ වගන්ති වලට යටත්ව, ඒ අනුව ක්‍රියා කිරීමට බැඳී සිටී. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතියේ වගන්තිය පහත සඳහන් පරිදි වේ:

**ප්‍රඥප්ති වගන්තීන්**

1. **පූර්විකාව**

2. **පරිච්ඡේදය I - පොදු විධිවිධාන**

| | |
|---|---|
| 1 වගන්තිය | අරමුණ පිළිබඳ ප්‍රකාශය |
| 2 වගන්තිය | පද භාවිතය |
| 3වගන්තිය | අයැදුම් විෂය පථය |
| 4 වගන්තිය | පරමාධිපත්‍යය ආරක්ෂා කිරීම |

3. **පරිච්ඡේදය II - වළක්වා ගැනීමේ පියවර**

| | |
|---|---|
| 5 වගන්තිය | ප්‍රති දූෂණ නිවාරණ ප්‍රතිපත්තීන් සහ භාවිතයන් |
| 6 වගන්තිය | ප්‍රති දූෂණ නිවාරණ ආයතන හෝ ආයතනයන් |
| 7 වගන්තිය | රාජ්‍ය අංශය |
| 8 වගන්තිය | රාජ්‍ය නිලධාරීන් සඳහා මෙහෙයුම් මූලධර්ම |
| 9 වගන්තිය | රාජ්‍ය ප්‍රසම්පාදනය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය |
| 10 වගන්තිය | රාජ්‍ය වාර්තාකරණය |
| 11 වගන්තිය | අධිකරණය සහ නඩු සේවා සම්බන්ධ පියවර |
| 12 වගන්තිය | පෞද්ගලික අංශය |
| 13 වගන්තිය | සමාජ සහභාගිත්වය |
| 14 වගන්තිය | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා පියවර |

4. **පරිච්ඡේදය III - අපරාධ ක්‍රියා සහ නීතිය බලාත්මක කිරීම**

| | |
|---|---|
| 15 වගන්තිය | ජාතික රාජ්‍ය නිලධාරීන්ගේ අල්ලස් |
| 16වගන්තිය | විදේශ රාජ්‍ය නිලධාරීන් සහ ජාත්‍යන්තර රාජ්‍ය ආයතනයන්හි අල්ලස් |
| 17වගන්තිය | රාජ්‍ය නිලධාරියකු විසින් සිදු කල වංචා සහ දේපල සොරාකෑම සහ පිටමංකිරීම |
| 18 වගන්තිය | බලපෑම් තුල වෙළඳාම |
| 19 වගන්තිය | කාර්යයන් අපයෙදුම් |
| 20වගන්තිය | නීති විරෝධී ධනවත් වීම් |
| 21 වගන්තිය | පෞද්ගලික අංශයේ අල්ලස් |
| 22වගන්තිය | පෞද්ගලික අංශයේ දේපළවංචාවන් |
| 23වගන්තිය | අපරාධ ක්‍රියාවන්හි විශුද්ධිකරණය |
| 24 වගන්තිය | යටපත් කිරීම් |
| 25වගන්තිය | යුක්තියටබාධා |
| 26වගන්තිය | නීතිමය පුද්ගලයන්ගේ වගකීම් |

27 වගන්තිය සහභාගිත්වය සහ උත්සාහය
28වගන්තිය වරදක මූලිකාංග ලෙස දැනුම, අදහස් හා අරමුණ
29 වගන්තිය නීතිමය සීමාවන්
30 වගන්තිය නඩු පැවරීම්, විනිශ්චයට භාජනය වීම් සහ සම්බාධක
31වගන්තිය තාවකාලික තහනම්, පැහැර ගැනීම සහ රාජ්‍ය සන්තක කිරීම
32වගන්තිය සාක්ෂිකරුවන්, විශේෂඥයන් සහ විපතට පත් වූවන් ආරක්ෂා කිරීම
33 වගන්තිය වාර්තා කරන පුද්ගලයන් ආරක්ෂා කිරීම
34 වගන්තිය දූෂණ ක්‍රියාවල ප්‍රතිවිපාක
35 වගන්තිය හානි සඳහා වන්දි
36 වගන්තිය විශේෂඥ බලධාරීන්
37වගන්තිය නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම
38වගන්තිය ජාතික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
39 වගන්තිය ජාතික ආයතන සහ පෞද්ගලික අංශ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
40වගන්තිය බැංකු රහස්‍යභාවය
41 වගන්තිය අපරාධ වාර්තාවන්
42වගන්තිය අධිකරණ බලය

5. පරිච්ඡේදය **IV -ජාත්‍යන්තර සහයෝගීතාවය**

43වගන්තිය ජාත්‍යන්තර සහයෝගීතාවය
44වගන්තිය උද්ධර්පණය / චූදිතයා සිය රටට භාර දීම
45 වගන්තිය දඬුවම නියම පුද්ගලයන් මාරු කිරීම
46 වගන්තිය සබඳතා මත ආධාර
47 වගන්තිය සාපරාධී නඩු මාරු කිරීම
48 වගන්තිය නීතිය ක්‍රියාත්මක කිරීමේ සහයෝගීතාවය
49වගන්තිය ඒකාබද්ධ විමර්ශන
50වගන්තිය විශේෂ විමර්ශනාත්මක ශිල්පීය ක්‍රම

6. පරිච්ඡේදය **V - වත්කම් නැවත ලබා ගැනීම**

51වගන්තිය පොදු විධිවිධාන
52වගන්තිය සපරාධි මුදල් මාරුකිරීම් ඇල්ලීම සහ නැවත්වීම
53 වගන්තිය දේපල නැවත ලබා ගැනීම පිළිබඳ පියවර
54 වගන්තිය අත්අඩංගුවට ගැනීමේ ජාත්‍යන්තර සහයෝගීතාව තුළින් දේපල නැවත ලබා ගැනීමේ තත්වයට පත් කර ගැනීමේ යාන්ත්‍රණය
55 වගන්තිය රාජසන්තක කිරීම පිළිබඳ කටයුතු සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය
56 වගන්තිය විශේෂ සහයෝගීතාවය
57 වගන්තිය වත්කම් ආපසු ලබා ගැනීම සහ විකිණීම
58 වගන්තිය මූල්‍ය බුද්ධි ඒකකය
59 වගන්තිය ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් හා කටයුතු

7. පරිච්ඡේදය **VI - තාක්ෂණික සහාය සහ තොරතුරු හුවමාරු කිරීම්**

60 වගන්තිය පුහුණුව සහ තාක්ෂණික සහාය
61වගන්තිය දූෂණ පිළිබඳ තොරතුරු එකතු කිරීම, හුවමාරු කිරීම සහ විශ්ලේෂණය කිරීම
62 වගන්තිය වෙනත් පියවර: ආර්ථික සංවර්ධනය සහ තාක්ෂණික සහාය හරහා සම්මුතිය ක්‍රියාත්මක කිරීම

8. පරිච්ඡේදය VII - ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණය

| | |
|---|---|
| 63වගන්තිය | සම්මුතිය සඳහා රාජ්‍ය පාර්ශව සමුළුව |
| 64 වගන්තිය | ලේකම් කාර්යාලය |

9. පරිච්ඡේදය VIII - අවසන් විධිවිධාන

| | |
|---|---|
| 65 වගන්තිය | සම්මුතිය ක්‍රියාත්මක කිරීම |
| 66වගන්තිය | ආරවුල් නිරවුල් කිරීම |
| 67වගන්තිය | අත්සන් කිරීම, අපරානුමත කිරීම, පිළිගැනීම, අනුමැතිය සහ ප්‍රවේශය |
| 68 වගන්තිය | බලගතු වීම |
| 69 වගන්තිය | සංශෝධන |
| 70 වගන්තිය | අත්හැරීම |
| 71 වගන්තිය | තැන්පත් කිරීම් සහ භාෂාවන් |

ඒ අනුව, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතිය ප්‍රචලිත කිරීමට සහ එම සම්මුතියේ වගන්ති ක්‍රියාත්මක කිරීමට රටවල් දැනුවත් කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අංශයක් වන, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ (UNODC) අනුග්‍රහයෙන්, ජාත්‍යන්තර සංවිධානයක් වන දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර අධිකාරීය (IAACA) නමින් 2006 ඔක්තෝබර් මස බීජිං නගරයේදී, චීන රජය අනුග්‍රහය සහිතව ස්ථාපිත කරන ලදී. 2006 ඔක්තෝබර් මස සමාරම්භයේ සිටම කර්තෘ එහි තනි පුද්ගල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කල අතර, වර්තමානයේදී එහි සම්බන්ධීකාරයෙකු ලෙස කටයුතු කරයි.

ඒ අනුව, මෙම ග්‍රන්ථයෙන් දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර අධිකාරීය (IAACA) එම කාලයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමයන්ද එළිදරව් කර ඇත. දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර අධිකාරීයේ (IAACA) වාර්ෂිකව නොයෙකුත් රටවල පවත්වනු ලබන සම්මන්ත්‍රණයන්ට අමතරව, වංචාවට සහ දූෂණයට එරෙහිව ක්‍රියාකාරීන් දැනුවත් කිරීමට නිතර සාකච්ඡා සහ වැඩමුළුද පවත්වා ඇත. දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර අධිකාරීයේ (IAACA) කාර්ය සැලැස්ම සකස් කිරීම සඳහා, සාමාජිකයින් 30 ක ගෙන් සමන්විත වූ විද්වත් මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස කර්තෘවද තෝරා ගෙන තිබුණි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දූෂණයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය හා ඊට ආනුෂංගික තවදුරටත් වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා, එක්සත් ජාතීන් සෑම වර්ෂ දෙකකට වරක් රාජ්‍ය පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. මෑතක දී, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතියේ වගන්ති අනුව ප්‍රගතිය පිලිබඳව තෝරාගත් රටවල් ගණනක, 'සමාලෝචන කරන ක්‍රමයක්', අනෙක් රටවල් ගණනක් විසින් නිරීක්ෂණය කිරීම ආරම්භ කර තිබේ.

දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර අධිකාරීයට (IAACA) එම රාජ්‍ය පාර්ශව වල සම්මන්ත්‍රණ වලට 'නිරීක්ෂකවරුන්' ලෙස සහභාගී වීමට අවස්ථාව ඇති අතර, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතිය තවදුරටත් ශක්තිමත් වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටද අවස්ථාවද ඇත.

මෙම ග්‍රන්ථයේ විශේෂ ලක්ෂණයක් වන්නේ, කර්තෘ විසින් ඔහුගේ ජීවිතයේ ඔහු විසින් මුහුණ දුන් සත්‍ය අත්දැකීම් සහ අභියෝග උපයෝගී කරගනිමින්, වංචාව සහ දූෂණය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම වන අතර, වංචාවට සහ දූෂණයට එරෙහිව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් ඔහු විසින් හුවා දක්වන්නේ, මෙය සටන් වැදිය යුතු 'ආර්ථික ත්‍රස්තවාදය' ලෙසිනි. එසේ නොකලහොත් එම ආර්ථික ත්‍රස්තවාදය සන්නද්ධ ත්‍රස්තවාදය ඇති කිරීමට සහ බිහි කිරීමට පාදක වනු ඇති අතර සහ නුතන ලෝකයේ දක්නට ඇති ආකාරයට එය ගෝලීය වශයෙන් දියුණු වෙමින් ව්‍යාප්ත වීම සිදු වනු ඇත.


වංචා හා දූෂණ මැඩ පැවැත්වීම සඳහා කර්තෘ විසින් එසේ උත්සාහයන් දරා ඇත්තේ, ශ්‍රී ලංකාව බෞද්ධ දර්ශනයන් අනුගමනය කරන රටක් වන බැවින් ඒ මත පදනම්ව වන අතර, රටක් පාලනය කරන රජෙකුට එම රටේ තිබෙන සම්පත් අයිති නොවන බවත්, ඔහු විසින් රටේ මහජනතාව සතු එම සම්පත්හි විශ්වසනීය භාරකාරයෙකු ලෙස එම ජනතාව වෙනුවෙන් පාලනය කරන්නෙකු බවත් ලෙස මහින්ද මහාරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුට දේශනා කර සිටි බවට සඳහන් ක්‍රි.ව. 3 වන සියවසේ ලියවුණු වාර්තාවක් පදනම් කර ගෙන, විශේෂිතව ක්‍රි.ව. 543 සිට ඉතිහාසයට උරුමකම් කියන ඓතිහාසික මහාවංශයේ ("මහ පුරාවෘත්තය") වාර්තා වී ඇති පරිදිය.

තවද, කර්තෘ විසින් ඔහුගේ සත්‍ය අත්දැකීම් තුලින් එළිදරව් කර සිටින්නේ සුප්‍රසිද්ධ විදේශීය මූල්‍ය ආයතන, බැංකුව සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන යටතේ ඇතිකර ගනු ලබන ගනුදෙනු වලින්, මහජන මුදල් වගකීමකින් තොරව, වංචා කරමින් සහ එම මුදල් වලින් සූදුකෙළි ඇති බවද සනාථ කරමිනි.


මෙම ග්‍රන්ථයේ තවත් පරිච්ඡේදයකින්, වංචා සහ දූෂණ පිළිබඳව කර්තෘ විසින් විමර්ශනය කර  සහ පර්යේෂණය කර සකස් කොට ඔහු විසින් මාධ්‍යයේ පල කල ලිපි පෙළක් අඩංගු කර ඇති අතර, එම වංචා සහ දූෂණ පිලිබඳව ජාත්‍යන්තර තලයේ ප්‍රචලිත කර, මේ පිළිබඳ දැනුවත් කර, එමගින් මනා අවබෝධයක් සහ උනන්දුවක්  අධ්‍යාත්මිකව ලබා දීමට සහ වංචා සහ දූෂණ පිළිබඳ දැනුම පුද්ගලයන්ට ලබා දිමටත් කර්තෘ ක්‍රියා කර ඇත්තේ, එයට එරෙහිව සටන් වැදීමට අත්‍යවශ්‍ය බව පිළිඹිබු කරමිනි. ඒ අනුව, මෙම ලිපි පෙළේ අඩංගු කරුණු කරණා වංචාව සහ දූෂණය පිළිබඳව උනන්දුවක් දක්වන  සහ ක්‍රියාකාරීව සටන් කිරීමක් සිදු කරන පුද්ගලයන්ට ඉතාමත් වැදගත් වනු ඇත.


| | | |
|---|---|---|
| එළිදරව්ව 1 | - | දූෂණය සහ දේශපාලනය |
| එළිදරව්ව 2 | - | සැම තැනම දූෂණය |
| එළිදරව්ව 3 | - | දූෂණයට එරෙහිව නීතිය පැතීම |
| එළිදරව්ව 4 | - | දූෂණය වසන් කිරීම |
| එළිදරව්ව 5 | - | දූෂණය සහ පුහු දෙඩවීම |
| එළිදරව්ව 6 | - | පෙට්ටි ගණන් දූෂණ |
| එළිදරව්ව 7 | - | දූෂණය සහ නීතිය |
| එළිදරව්ව 8 | - | එකට එක සම්බන්ධ වූ අකුසල් මගින් දූෂණය |
| එළිදරව්ව 9 | - | දූෂණයට එරෙහි යෝජනා |
| එළිදරව්ව 10 | - | රාජ්‍යතන්ත්‍රික දූෂණ එළිඑදරව්ව |
| එළිදරව්ව 11 | - | පුද්ගලික අංශයේ දූෂණය |
| එළිදරව්ව 12 | - | දූෂණයේ හෙන්වායියලා |
| එළිදරව්ව 13 | - | විසන්වාදක සහ දූෂණය |
| එළිදරව්ව 14 | - | ප්‍රතිපත්තිය සහ දූෂණය |
| එළිදරව්ව 15 | - | දූෂණ ක්‍රියාකාරකම් |
| එළිදරව්ව 16 | - | දූෂිත ගනුදෙනු |
| එළිදරව්ව 17 | - | දූෂණයට එරෙහි ක්‍රියාකාරකම් |
| එළිදරව්ව 18 | - | දූෂණයෙන් ආවරණය |
| එළිදරව්ව 19 | - | දූෂණය මත දෙබිඩිතාවය |
| එළිදරව්ව 20 | - | සාක් රටවල් දූෂණය වෙත අන්ධවීම |
| එළිදරව්ව 21 | - | සාක් රටවල් දූෂණයට ඉඩදීම |
| එළිදරව්ව 22 | - | දූෂණය ඉස්මතු කිරීම |

විශ්මජනක ලෙස එළිදරව් කර ඇත්තේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක ප්‍රජාව, වංචාවට සහ දූෂණයට එරෙහිව විවේචනාත්මකව මහත් උද්ඝෝෂණයකින් අනුශාසනා කරන අතර, එම අවස්ථාවේදීම, විශ්මජනක ලෙස කර්තෘ සත්‍ය අත්දැකීම් සහ සිද්ධීන් ලේඛන මගින් තහවුරු කරමින් ඛේදජනක ලෙස එළිදරව් කර ඇත්තේ ලෝක බැංකුව සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන වංචාවට සහ දූෂණයට එරෙහිව විවේචනාත්මකව පුහු දේශනයන් කලද, සත්‍ය යථාර්ථය වන්නේ වංචාව සහ දූෂණයට එරෙහිව ඔවුන් ක්‍රියාකිරීමට අසාර්ථක වීම සහ / හෝ ක්‍රියා කිරීමට පසුබට වීමය. එලෙසම ශ්‍රී ලංකා රජයද එම යථාර්ථයම අනුගමනය කරන බව උදාහරණ සහිතව මෙම ග්‍රන්ථයේ සඳහන් කර ඇත.



2011 ඔක්තෝබර් මස එක්සත් ජාතීන්ගේ සම්මුතිය මත රාජ්‍ය පාර්ශවයන්ගේ 4 වන සමුළුවට ශ්‍රී ලංකාව ඛේදජනක ලෙසසහභාගී නොවීම




දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතිය

**ශ්‍රී ලංකාව එය කඩකර ඇද්ද ?**

මෙම ග්‍රන්ථය මගින් සැබවින්ම එළිදරව් කරන්නේ, ලෝකයේ ප්‍රචලිතව ව්‍යාප්ත වන වංචා සහ දූෂණයට එරෙහිව ගනු ලබන ජාත්‍යන්තර ප්‍රයත්නයන්, එක්සත් ජාතීන්ගේ සම්මුතියට බැඳුණු රටවල් වල වගකීම් සහ වගවීම් විදහා පාමින්, එයට එරෙහිව අනුගමනය කල යුතු ක්‍රියා මාර්ගයන්ද, ඒ අනුව එක්සත් ජාතීන්ගේ සම්මුතියේ වගන්ති වලට අනුව වංචා සහ දූෂණයට එරෙහි නීති සකස් කිරීම සහ එම නීති ක්‍රියාත්මක කරන ආයතන සහ හැකියාව දේශපාලන බැඳීමකින් වංචාව සහ දූෂණය විමර්ශනය කොට නීතිය ක්‍රියාත්මක කිරීමය. එමනිසා මෙම ග්‍රන්ථය ප්‍රායෝගික වශයෙන් මෙම ක්‍රියාදාමයන්හි යොමු වී සිටි පාර්ශවයන්ට අත්වැලක් වේ.